**#MediaEthicsSL #SinhalaPress #lka #Divaina #Dinamina #Lankadeepa #Anidda #Resa #Mawbima #SundayLankaadeepa #SundayDivaina #SundayMawbima #December #January**

මාවනැල්ල ප්‍රදේශය අවට සිදුවූ බුදු පිළිමයන්ට හානි කිරීමේ සිදුවීම පුවත්පත් ඔස්සේ වාර්තා කොට තිබූ අයුරු මෙසේයි. මෙහිදී අප විසින් අවධානයට ගනු ලැබුවේ අදාළ සිදුවීමේ සැකකරුවන්ව හඳුන්වා දී ඇති ආකාරයත්, සැකකරුවන්ගේ ඡායාරූප පළ කිරීම සහ නොකිරීමත් වේ. මෙහිදී සැකකරුවන් ලෙසින් පමණක් එම අදාළ අයවලුන් හඳුන්වා දී ඇති පුවත්පත් වාර්තාවන් මෙන්ම, සැකකරුවන්ව අපරාධකරුවන් බවට හඟවමින් කරනු ලැබූ හැඳින්වීම්ද දැකගැනීමට හැකි විණි. බොහෝ පුවත්පත් වාර්තාවන් තුළ සැකකරුවන්ගේ ඡායාරූපයන් පළ කොට නොතිබූ අතර, අප විසින් නිරීක්ෂණය කළ පුවත්පත් තුළ වූ ලිපි කිහිපයක පමණක් සැකකරුවන්ගේ ඡායාරූප අනන්‍යතාවය හෙළිවන අයුරින් පළ කොට තිබිණි.

මෙහිදී විශේෂයෙන්ම නිරීක්ෂණයට ලක්වන කරුණ වන්නේ ඇතැම් පුවතක මෙම සිදුවීමට සැක පිට අත් අඩංගුවට ගත්තවුන්ව සැකකරුවන් ලෙසින් හඳුන්වා දී තිබියදී, තවත් පුවතක ඔවුන්ව නරුමයින්, අධමයින්, සාහසිකයින් ලෙසින් හඳුන්වා දී තිබීමයි. මෙසේ සැකකරුවන් නීතිය ඉදිරියට පමුණුවා, නීතිය පසිඳලීමෙන් අනතුරුව ඔවුන් වරදකරුවන් ලෙසින් තීරණය කිරීමට පෙරාතුවම ඔවුන්ව අපරාධකරුවන් ලෙසින් හංවඩු ගැසීම යුක්තියුක්ත වේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?